**මාධ්‍ය නිවේදනය**

**වසර 2020දී රක්ෂණ ක්ෂේත්‍රයේ කාර්යසාධනය**

රක්ෂණ සමාගම් සංඛ්‍යාව


2020 සැප්තැම්බර් 30 දිනට රක්ෂණ සමාගම් විසි හතක් (27) ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි ලියාපදිංචි වී ඇත. ඒ අතරින් දෙකක් දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය මෙන්ම සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ ගණු දෙනු කරන සංයුක්ත සමාගම් වන අතර සමාගම් දහතුනක් (13) දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි ද සමාගම් දොළහක් (12) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහිද නිරත වී සිටියි.

දළ ලිඛිත වාරිකය

2020 වසරේ තෙවන කාර්තුව තුළ සමස්ථ දළ ලිඛිත වාරිකයට අදාළව 3.7%ක වර්ධනයක් ළඟා කර ගැනීමට රක්ෂණ කර්මාන්තයට හැකි වූ අතර එය 2019 වසරේ එම කාල සීමාවට සාපේක්ෂව රු.මි. 5,231ක ඉහළ යාමකි. 2020 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා දිගුකාලීන රක්ෂණ හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සඳහා වූ දළ ලිඛිත වාරිකය රු.මි. 145,391 (3 වන කාර්තුව, 2019: රු.140,160) විය.

දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාළ දළ ලිඛිත වාරිකය රු.මි. 72,297 (3 වන කාර්තුව, 2019: රු.මි. 63,913) වූ අතර වාර්තා කළ වර්ධනය 13.12%කි. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළ දළ ලිඛිත වාරිකය රු.මි. 73,094 (3 වන කාර්තුව, 2019: රු.මි. 76,247 ) වූ අතර වර්ධනයෙහි 4.14%ක අඩු වීමක් වාර්තා විය.


1 වන ප්‍රස්තාරය - දළ ලිඛිත වාරික ආදායම



මුළු වත්කම්

2020 සැප්තැම්බර් 30 දිනට රක්ෂණ සමාගම්හි මුළු වත්කම්හි අගය රු.මි. 747,489 දක්වා ඉහළ ගිය අතර එය 2019 සැප්තැම්බර් 30 දිනට වර්තා වූ රු.මි. 675,093ට සාපේක්ෂව 10.72%ක වර්ධනයකි. දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි වත්කම් රු.මි. 556,157 (3 වන කාර්තුව, 2019; රු.මි. 480,332) වූ අතර එය 15.79%ක වර්ධන අනුපාතයක් පෙන්නුම් කරයි. 2020 වසරේ 3වන කාර්තුව අවසානය වන විට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි වත්කම් රු.මි. 191,332 (3 වන කාර්තුව, 2019: රු.මි. 194,761) වූ අතර එමගින් 1.76%ක අඩු වීමක් වර්ධන වේගයෙහි පෙන්නුම් කළේය.

2 වන ප්‍රස්තාරය - මුළු වත්කම්





රාජ්‍ය ණය සුරැකුම් පත්වල ආයෝජනය කිරීම

2020 3වන කාර්තුව අවසානය වන විට රාජ්‍ය ණය සුරැකුම් පත්වල සිදු කළ ආයෝජනය රු.මි. 224,173 වූ අතර එය දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි මුළු ආයෝජනයන්ගෙන් 45.6% (3 වන කාර්තුව, 2019; රු.මි. 205,202; 48%) නියෝජනය කර ඇත. දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළව රාජ්‍ය ණය සුරැකුම් පත්වල සිදු කළ මුළු ආයෝජන ප්‍රමාණය රු.මි. 268,437ක් (3 වන කාර්තුව, 2019; රු.මි. 248,409). ඒ අනුව දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි හා සාමාන්‍ය රක්ෂණයෙහි රාජ්‍ය ණය සුරැකුම්පත්වල ආයෝජනය පිළිවෙලින් 9.25% හා 2.45% කින් ඉහළ ගොස් ඇත.

**රක්ෂණ සමාගම් විසින් දරණ ලද හිමිකම් පෑම්**

2020 3වන කාර්තුව තුළ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළව **රක්ෂණ සමාගම්** විසින් දරණ ලද හිමිකම් පෑම් රු.මි. 55,965 (3 වන කාර්තුව: රු.මි. 63,361) වූ අතර එය පසුගිය වසරට සාපේක්ෂව මුළු හිමිකම් පෑම් ප්‍රමාණයෙහි 11.67%ක අඩු වීමකි. කල් පිරීම් ප්‍රතිලාභ හා මරණ ප්‍රතිලාභ ඇතුළුව දිගුකාලීන රක්ෂණ හිමිකම් පෑම් ප්‍රමාණය රු.මි. 27,521 (3 වන කාර්තුව, 2019: රු.මි. 26,570) විය. මෝටර් රථ, ගිනි, මුහුදු හා වෙනත් කාණ්ඩ ඇතුළුව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළ හිමිකම් පෑම් ප්‍රමාණය රු.මි. 28,444 (3 වන කාර්තුව, 2019: රු.මි. 36,791) විය. ඒ අනුව, 2019 වසරේ 3 වන කාර්තුවට සාපේක්ෂව 2020 වසරේ එම කාල සීමාව තුළ දිගුකාලීන රක්ෂණයට අදාළ හිමිකම් පෑම්හි 3.58%ක ඉහළ යාමක් සිදු වී ඇති අතර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළ හිමිකම් පෑම් ප්‍රමාණය 22.69%න් අඩු වී ඇත. දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරිකයෙහි ප්‍රතිශතයක් ලෙස දිගුකාලීන රක්ෂණයට අදාළ හිමිකම් පෑම් ප්‍රමාණය 38%ක් (2019: 42%) වන අතර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරිකයෙහි ප්‍රතිශතයක් ලෙස සාමාන්‍ය රක්ෂණයට අදාළ හිමිකම් පෑම් ප්‍රමාණය 39% (2019; 48%) විය.

3 වන ප්‍රස්තාරය - **රක්ෂණ** සමාගම් **විසින් දරණ** ලද හිමිකම් පෑම්





**රක්ෂණ සමාගම්හි ලාභය (බදු පෙර)**

2020 වසරේ 3වන කාර්තුව අවසානය වන විට දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළව රක්ෂණ සමාගම්හි ලාභය (බදු පෙර) රු.මි. 20,159 (3 වන කාර්තුව, 2019: රු.මි. 18,119) වූ අතර එය මුළු ලාභයෙහි 11.26%ක ඉහළ යාමකි. දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි ලාභය (බදු පෙර) රු.මි. 9,978 (3

වන කාර්තුව, 2019: රු.මි. 12,220) වූ අතර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි ලාභය (බදු පෙර) රු.මි. 10,181 (3 වන කාර්තුව, 2019: රු.මි. 5,899) විය. ඒ අනුව, දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි ලාභය (බදු පෙර) 18.34%න් අඩු වී ඇති අතර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි ලාභය (බදු පෙර) 72.59%න් ඉහළ ගොස් ඇත.

4 වන ප්‍රස්තාරය - රක්ෂණ සමාගම්හි ලාභදායී බව




සටහන්-

*1) ඉහත විශ්ලේෂණයට ජාතික රක්ෂණ භාර අරමුදල හා කෝපරේටිව් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් යන ආයතනවලට අදාළ තොරතුරු ඇතුළත් නොවේ.*

*2) ජීවිත කාණ්ඩය සඳහා වන රක්ෂණ සමාගම්වලට අදාළ හිමිකම් පෑම් සඳහා දළ ප්‍රතිලාභ හා ගෙවන ලද හිමිකම් පෑම් සහ ප්‍රතිරක්ෂණකරුවන් වෙත පවරන ලද හිමිකම් පෑම් පමණක් සලකා බලන ලදී.*

**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව**

**11 වන මහල,**

**නැගෙනහිර කුළුන**

**කොළඹ 01**

| | |
|---|---|
| වෙබ් අඩවිය: www.ircsl.gov.lk | ඊමේල්: info@ircsl.gov.lk |
| දුරකථන: 011 2396184 -9 | ෆැක්ස් 011 2396190 |

**2021/01/07**